**සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2018**

---

සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2018 ඔක්තෝබර් 26 දින එළඹි පිළිවෙලින් අංක 3727 - එස්ආර්අයි(සීඕඑල්) සහ අංක 0618- එස්ආර්අයි(එස්එෆ්) දරන ණය හා ප්‍රදාන ගිවිසුම් සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය හා ප්‍රදාන ගිවිසුම් අනුව, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මධ්‍යම, උතුරු මැද, සබරගමුව හා ඌව යන පළාත් සභා හතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ, ගුණාත්මක අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවාවන් සඳහා විශ්වීය ප්‍රවේශය සහ අඛණ්ඩව රැකවරණය සැපයීම යන සංකල්පය මත පදනම්ව ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතියේ කාර්යක්ෂමතාව, සමානාත්මතාවය සහ ප්‍රතිචාරාත්මක බව වැඩි දියුණු කිරීම වේ. ණය සහ ප්‍රදාන ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 9,300 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 60 ක් වන අතර ඉන් ණය වශයෙන් රු.මිලියන 5,813 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 37.50 ක්ද, ප්‍රදාන වශයෙන් වූ රු.මිලියන 1,937 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 12.50 ක්ද මූල්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2018 දෙසැම්බර් 01 දින ආරම්භ කර තිබුණු අතර, 2023 නොවැම්බර් 30 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි.

## 1.3 මතය

---

ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය සහ එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| කාර්යය | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| භාණ්ඩ, වැඩ සහ සේවා ප්‍රසම්පාදනය සඳහා ලංසු කැඳවීම. | ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව, පළාත් රෝහල් 135 ක ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතියේ කාර්යක්ෂමතාව, සමානාත්මතාවය සහ ප්‍රතිචාරාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා වන ක්‍රියාකාරකම්වල ව්‍යාපෘතිය නියැලී ඇති අතර උපකරණ, ගෘහ භාණ්ඩ හා උපදේශන සේවා ආදිය සඳහා ප්‍රසම්පාදන කටයුතු 28 ක් යටතේ ලංසු කැඳවීමේ ක්‍රියාවලිය 2018 දෙසැම්බර් 31 වන විට අවසන් කළ යුතුය. ලැබුණු තොරතුරු අනුව, එදින වන විට ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 181.35 ක කාර්යාල උපකරණ, ගෘහ භාණ්ඩ හා උපදේශන සේවා ප්‍රසම්පාදන කටයුතු 03 ක් පමණක් අවසන් කර තිබුණි. | ප්‍රසම්පාදන කටයුතු අවසන් කිරීමේදී සිදුවිය හැකි ප්‍රමාදයන්. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අත්පොතේ ක්ෂේත්‍ර කිහිපයක්, ප්‍රධාන වශයෙන් ප්‍රසම්පාදන සැලැස්ම, අවශ්‍යතාවයන්හි ප්‍රමුඛතාවය, මූලික ක්‍රියාකාරී සැලැස්මේ වෙනස් කිරීම් සහ අරමුදල් ප්‍රවාහය වැනි හේතු නිසා වරින් වර සංශෝධනයට භාජනය කරන ලදී. | ක්‍රියාකාරී සැලැස්මට අනුව වැඩ නිම කිරීම සඳහා කටයුතු කඩිනම් කළ යුතුය. |

### 2.2 කොන්ත්‍රාත් පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) පිරිවැය රු. මිලියන 4.89 ක් වූ ගෘහ භාණ්ඩ ප්‍රසම්පාදනය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර නොතිබුණු අතර වසර 03 ක සුරක්ෂණයක් වෙනුවට වසර 01 ක | බාල තත්ත්වයේ ගෘහ භාණ්ඩ සැපයීමට ඉඩ දීම සහ සැපයුම්කරුට එරෙහිව පියවර | ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කරන අවස්ථාවේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය පිහිටුවා නොතිබුණු බව. | ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විනිවිදභාවය සහතික කිරීම සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල |

| | | | | |
|---|---|---|---|---|
| | කාලසීමාවක් සඳහා කාර්යසාධන ඇපකරයක් තෝරාගත් සැපයුම්කරුගෙන් ලබාගෙන තිබුණි. | ගැනීමට ඇති අවස්ථාව අඩුවීම. | | දක්වා ඇති අවශ්‍යතා අදාළ කර ගත යුතුය. |
| (ආ) | ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 15 ඉක්මවන ප්‍රසම්පාදන, ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව යටතේ ජාතික තරඟකාරී ලංසු කැඳවීමෙන් සිදුකළ යුතු වුවද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 ඡේදයට පටහැනිව, ව්‍යාපෘතිය මගින් ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 23.25 ක කාර්යාල උපකරණ වෙළඳපල මිල සැදැහුම් ක්‍රමය මගින් මිලදී ගෙන තිබුණි. | ලංසුකරුවන් අතර තරඟකාරිත්වය සහතික නොවීම. | මූලික ව්‍යාපෘති ප්‍රසම්පාදන සැලැස්මට අනුව, වසර 5 ක කාලය තුළ ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයට සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකවලට කාර්යාල උපකරණ ලබා ගැනීමට අපේක්ෂා කළ අතර වරින් වර ප්‍රසම්පාදනය සම්පූර්ණ කරන ලදී. එනිසා, මෙම පැකේජය යටතේ 2018 දී සිදු කරන ලද ප්‍රසම්පාදනය උපරිම සීමාව ඉක්මවා නොතිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විනිවිදභාවය සහතික කිරීම සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල දක්වා ඇති අවශ්‍යතා අදාළ කර ගත යුතුය. |

**2.3 මතභේදයට තුඩුදෙන කරුණු**

**----------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **බලපෑම** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| --------------------- | ---------- | ------------------------ | ------------- |
| ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට කාර්යාල ඉඩකඩ කුලියට ගැනීම සඳහා ලංසුකරුගේ අත්සනකින් තොරව ඉදිරිපත් කළ ලංසුවක් ඇගයීම් කර ඇති බව නිරීක්ෂණය විය. තවද, ඉහත සඳහන් කාර්යය සඳහා වංචනික ලෙස ලංසු 03 ක් එකම ලංසුකරු විසින් ඉදිරිපත් කර තිබුණු බව අනාවරණය විය. | වංචනික ගනුදෙනුවක් සඳහා ඉඩකඩ ලබා දී ඇත. | ලංසුකරුගේ අත්සනක් නොමැති ලංසුව වලංගු ලංසුවක් නොවන අතර එය ලංසු ඇගයීමේදී ප්‍රතික්ෂේප කළ යුතුය. මෙම අවස්ථාවේ දී වැරදීමකින් එවැනි ලංසුවක් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් වැඩිදුර ඇගයීම සඳහා සලකා ඇත. | ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විනිවිදභාවය සහතික කිරීම සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල දක්වා ඇති අවශ්‍යතා අදාළ කර ගත යුතුය. |